

අනටම ආපු අගමැති පුටුව අහිමිවූ සී.පී

බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබාගත් පසුව ගත වුණු පළමු දශක තුන තුළදී ලංකාව (සිලෝන්) නමින් හැඳින්වූ ශ්‍රී ලංකාවේ ප්‍රබලම පුද්ගලයා වූයේ අගමැතිවරයායැ. 1978 දී විධායක ජනාධිපති ධුරය හඳුන්වා දුන් පසු අගමැති ධුරයට හිමිව තිබුණු රැස් වළල්ල අහිමිව ගියේය. එතෙක් බොහෝ දේශපාලනඥයන් ගිජු ලෙස ග්‍රහණය කරගනු ලැබුවේ ගෞරවණීය වූ අගමැති පදවියයි. අගමැති ධුරය ලැබීමට සුදුසුකම් තිබියදී දෙවතාවක් එම ධුරය ගිලිහුණු මිනිසකු පිළිබඳව මතකය ඔස්සේ කියන කතා පුවත උදෙසා අද මෙම ලිපිය වෙන් වේ.

1959 සැප්තැම්බර් සහ 1960 අප්‍රේල් මාසයේ යන දෙවතාවේම දෙවය ඔහුට සරදම් කළේය. මෙම දෙවරක් අගමැති ධුරය නොලැබී ගිය තැනැත්තා නම් අනෙකකු නොව සී.පී. ද සිල්වා ය. ඔක්තෝබර් මස 9 වැනිදට ඔහු මෙලොව හැර ගොස් වසර 50ක් සපිරුණි.

චාර්ල්ස් පර්සිවල් ද සිල්වා උපත ලැබුවේ 1912 අප්‍රේල් 16 වැනිද බලපිටියේ රන්දෙඹේ ප්‍රදේශයේය. නීතිඥයකු වූ සී.ආර්. ද සිල්වා ඔහුගේ පියා වූ අතර, මියුසියස් විද්‍යාලය අරම්භ කිරීමට දායකත්වයක් දැරූ ඇඩ්ලින් ද සිල්වා ඔහුගේ මව වූවාය. බොහෝ දෙනා සාමාන්‍යයෙන් සී.පී. නමින් හැඳින්වූ සී.පී. ද සිල්වා 1935 ලංකා සිවිල් සේවාවට ඇතුළත් වූයේය. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ ධුරය 1950 දී දරණ විට හෙතෙම සිවිල් සේවාවෙන් ඉල්ලා අස් වූයේය.

1951 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක එක්සත් ජාතික පක්ෂයෙන් වෙන් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටවූයේය. සී.පී. ද සිල්වා එවිට ශ්‍රී ල.නි.ප.යට එක්වී දේශපාලනයට පිවිසියේය. 1952 දී සහ 1956 දී ඔහු පොලොන්නරුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වූයේය. ඉන් අනතුරුව අලුතෙන් සීමා නිර්ණය කරනු ලැබූ මින්නේරිය මැතිවරණ කොට්ඨාසයට තරග කරනු ලැබ 1960 මාර්තු සහ ජූලි මැතිවරණවලදී එම ආසනය ජය ගත්තේය. අවුරුදු 18ක් දීර්ඝ වූ ඔහුගේ පාර්ලිමේන්තු කාලය තුළ 1956-59, 1960-64 සහ 1965-70 යන වසරවල කැබිනට් අමාත්‍යවරයකු ලෙස සේවය කළේය. හෙතෙම සභා නායක ධුරයත්, විපක්ෂ නායක ධුරයත්, වැඩ බලන අගමැති ධුරයත් එම කාලය තුළ උසුලා තිබේ. කෙසේ වුව ද දෙවතාවක්ම ඔහුගේ අතේ දුටින් තිබූ අග්‍රාමාත්‍ය තනතුර ඔහුට හොලැබී ගියේය.

1956 පාර්ලිමේන්තු මැතිවරණය, මේ රටේ දේශපාලන ඉතිහාසය එකඟෙලා වෙනසකට ලක් කළ මැතිවරණයක් විය. 1947 පටන් බලයේ සිටි එක්සත් ජාතික පක්ෂය එවර පරාජය විය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක විසින් නායකත්වය දැරූ ශ්‍රී ල.නි.ප.ය, මහජන එක්සත් පෙරමුණ නම් සභාගයේ කොටසක් වී මැතිවරණයෙන් විශිෂ්ට ජයක් ලැබීය. ඒ අනුව එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා බවට පත්විය.

අගමැති බණ්ඩාරනායකට 1959 සැප්තැම්බර් 25 වැනිද තල්දූවේ සෝමාරාම විසින් වෙඩි තබනු ලැබීය. ඔහු මියගියේ 26 වැනිදය. එවකට සභානායක ධුරය ඉසුලුවේ, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය සී.පී. ද සිල්වා වූ අතර, ශ්‍රී ල.නි.ප.යේ වඩාත් ජ්‍යෙෂ්ඨතම අමාත්‍යවරයා වුයේ ද ඔහුය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගෙන් අනතුරුව ඔහුගේ ධුරයට පත්වෙනැයි පුළුල්ව පිළිගැනුණේ ඔහුගේ දෙවැනියා වූ සී.පී. ද සිල්වා ය.

කෙසේ වුව ද බණ්ඩාරනායකගේ මරණින් පසුව එතැනට පත් වූයේ සී.පී. නොව එවකට අධ්‍යාපන ඇමැති තනතුර හෙබවූ විජයානන්ද දහනායක යි. ඔහු ඒ අනුව අගමැති තනතුරේ දිවුරුම් දුන්නේය. සිංහල භාෂා පෙරමුණෙන් පත්ව, ගාල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා අගමැති ධුරයට පත්වූයේ හුදෙක් වාසනාව නිසාමය. එසේ සිදු වූයේ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ඝාතනය වන විට සී.පී. ද සිල්වා මෙරට නොසිටි නිසාත්, දහනායක නිසි වෙලාවට නිසි තැන සිටි නිසාත්ය. සී.පී. ද සිල්වා කොළඹ සිටියේ නම්, දහනායක, බණ්ඩාරනායකගෙන් අනතුරුව එම තනතුරට පත් වන්නේ නැත.

කිරි බීමෙන් පසු රෝගී වීම

එසේ සිදු වූයේ 1959 අගෝස්තු 25 වැනිද සී.පී. කැබිනට් රැස්වීම තිබූ සාකච්ඡා කාමරයේදී කිරි වීදුරුවක් පානය කිරීමෙන් අනතුරුව රෝගී වීම නිසාය. වළඳළුවලින් පෙරා ගන්නා ලද යම් විෂ සහිත ද්‍රව්‍යයක් වීදුරුවේ අඩංගුව තිබුණේ යයි සැක කෙරිණි. එය අගමැති බණ්ඩාරනායක ගොදුරු කරගන්නා අභිප්‍රායෙන් තිබූ චකකයි ද සැකයට භාජන විය. සී.පී.ගේ තත්ත්වය අසාධ්‍ය වූ නිසා වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට ඔහුට ලන්ඩනයට යෑමට සිදු වූයේය.

ඝාතනය සිදු වන විට ඔහු සිටියේ ලන්ඩනයේය. දෙවය සී.පී.ට සරදම් කළේ ඒ ආකාරයටයි. ඊට පෙර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සහභාගි වීම පිණිස සැප්තැම්බර් 26 වැනිද සවස බණ්ඩාරනායක නිව් යෝර්ක් බලා යන්නට තීරණය කර තිබිණි. සී.පී. ද සිල්වා විදේශගතව සිටි බැවින් බණ්ඩාරනායක, වැඩ බලන අගමැතිවරයා ලෙස දහනායකව පත් කිරීමට තීරණය කළේය. සැප්තැම්බර් 24 වැනිද එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා බවට පත්විය.

අගමැති බණ්ඩාරනායකට 1959 සැප්තැම්බර් 25 වැනිද තල්දූවේ සෝමාරාම විසින් වෙඩි තබනු ලැබීය. ඔහු මියගියේ 26 වැනිදය. එවකට සභානායක ධුරය ඉසුලුවේ, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍ය සී.පී. ද සිල්වා වූ අතර, ශ්‍රී ල.නි.ප.යේ වඩාත් ජ්‍යෙෂ්ඨතම අමාත්‍යවරයා වුයේ ද ඔහුය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගෙන් අනතුරුව ඔහුගේ ධුරයට පත්වෙනැයි පුළුල්ව පිළිගැනුණේ ඔහුගේ දෙවැනියා වූ සී.පී. ද සිල්වා ය.

කෙසේ වුව ද බණ්ඩාරනායකගේ මරණින් පසුව එතැනට පත් වූයේ සී.පී. නොව එවකට අධ්‍යාපන ඇමැති තනතුර හෙබවූ විජයානන්ද දහනායක යි. ඔහු ඒ අනුව අගමැති තනතුරේ දිවුරුම් දුන්නේය. සිංහල භාෂා පෙරමුණෙන් පත්ව, ගාල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා අගමැති ධුරයට පත්වූයේ හුදෙක් වාසනාව නිසාමය. එසේ සිදු වූයේ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ඝාතනය වන විට සී.පී. ද සිල්වා මෙරට නොසිටි නිසාත්, දහනායක නිසි වෙලාවට නිසි තැන සිටි නිසාත්ය. සී.පී. ද සිල්වා කොළඹ සිටියේ නම්, දහනායක, බණ්ඩාරනායකගෙන් අනතුරුව එම තනතුරට පත් වන්නේ නැත.

කිරි බීමෙන් පසු රෝගී වීම

එසේ සිදු වූයේ 1959 අගෝස්තු 25 වැනිද සී.පී. කැබිනට් රැස්වීම තිබූ සාකච්ඡා කාමරයේදී කිරි වීදුරුවක් පානය කිරීමෙන් අනතුරුව රෝගී වීම නිසාය. වළඳළුවලින් පෙරා ගන්නා ලද යම් විෂ සහිත ද්‍රව්‍යයක් වීදුරුවේ අඩංගුව තිබුණේ යයි සැක කෙරිණි. එය අගමැති බණ්ඩාරනායක ගොදුරු කරගන්නා අභිප්‍රායෙන් තිබූ චකකයි ද සැකයට භාජන විය. සී.පී.ගේ තත්ත්වය අසාධ්‍ය වූ නිසා වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට ඔහුට ලන්ඩනයට යෑමට සිදු වූයේය.

ඝාතනය සිදු වන විට ඔහු සිටියේ ලන්ඩනයේය. දෙවය සී.පී.ට සරදම් කළේ ඒ ආකාරයටයි. ඊට පෙර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමට සහභාගි වීම පිණිස සැප්තැම්බර් 26 වැනිද සවස බණ්ඩාරනායක නිව් යෝර්ක් බලා යන්නට තීරණය කර තිබිණි. සී.පී. ද සිල්වා විදේශගතව සිටි බැවින් බණ්ඩාරනායක, වැඩ බලන අගමැතිවරයා ලෙස දහනායකව පත් කිරීමට තීරණය කළේය. සැප්තැම්බර් 24 වැනිද එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිවරයා බවට පත්විය.

ශ්‍රී ල.නි.ප. කෙරුම්කාරයෝ සැලෙන්නට ගත්හ

මැතිවරණයක් පැවැත්වීමට නියමිත බව නිවේදනය කිරීමත් සමගම දේශපාලන වාතාවරණය මුළුමනින් වෙනස් වී ගියේය. ශ්‍රී ල.නි.ප.යේ ලොකු ලොක්කෝ සැලෙන්නට ගත්හ. රටේ මතවාද ආණ්ඩු පක්ෂයටත්, ආණ්ඩුවටත් එරෙහි එකක් බවට පත් වූයේය. අපේක්ෂාභංගත්වයට පත් ඇතැම් ශ්‍රී ල.නි.ප. නායකයන් හිටපු ව.ජා.ප. අගමැතිවරුන් දෙදෙනකු වෙත එළැඹෙන තරමට කටයුතු දුර දිග ගියේය. ජෝන් කොතලාවල දේශපාලනයෙන් එළවා දැමීමට සාර්ථක උත්සාහයක යෙදුණු ශ්‍රී ල.නි.ප., ඒ වන විට දේශපාලනයෙන් විශ්‍රාම ගෙන සිටි ඔහුගේ නායකත්වය සොයන්නට වීම දෙවය ආපසු හැරැවීමක් හා සමාන වූයේය. හොඳින් කතාබහ කළ සර් ජෝන් වීම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. දේශපාලනයේ ක්‍රියාකාරීව නියැළීමට වඩා කැළෑවලත්තන්, කෙන්ට් ප්‍රාන්ත අතරත් එහෙ මෙහෙ යෑම ඔහු ප්‍රිය කළේය. ඔවුහු ඉන් පසු ව.ජා.ප. නායක ඩඩ්ලි සේනානායක වෙත හැරුණේය. වීම ඉල්ලීමෙන් ඔහු විශ්මයට පත් වුව ද එකඟෙළුම වීම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. සේනානායක දැඩි සේ ව.ජා.ප.යට පක්ෂපාතව ඉන්නා අතර, ශ්‍රී ල.නි.ප.යේ අරමුණු ගිලිහී යන ආකාරය ද දුටුවේය. දිනන අශ්වයා අත හැර පරදින අශ්වයාගේ රැහැන් පට අතට ගැනීමේ අභිප්‍රායක් ඩඩ්ලිට නොතිබිණි. ශ්‍රී ල.නි.ප. නායකයන් සිතා බලා ගත් තවත් පියවරක් වූයේ, මහාචාර්ය ගුණපාල මලලසේකරගෙන් නායකත්වය ගන්නා ලෙස ඉල්ලා සිටීමයි. ඔහු එවකට නිව් යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මෙරට නිත්‍ය නියෝජිතයා ලෙස කටයුතු කළේය.

ව.ජා.ප.යෙන් හෝ වෙන කොතැනකින් හෝ අලුත් නායකත්වයක් සොයාගන්නට ශ්‍රී ල.නි.ප.යේ කොටසක් දැරූ උත්සාහය පිළිබඳව "The Inside Story" නම් හියු ප්‍රනාන්දුගේ සඟරාවක වාර්තා වී තිබේ. නාත්තන්ඩියේ හිටපු මන්ත්‍රීවරයා වූ ඔහු, කාලයක් පාර්ලිමේන්තුවේ කතානායකවරයා ලෙස ද කටයුතු කළේය.

මේ අතරවාරයේ පක්ෂයේ එක්සත්භාවය රැක ගනිමින් දේශපාලන පුනරාගමනය ලබාගන්නට සී.පී. සිය උපරිම හැකියාව යොදු කටයුතු කළේය. ඔහු සතුව තිබූ අත්දැකීම් හා සුදුසුකම් අනුව ශ්‍රී ල.නි.ප.යේ නායකකත්වයට සැබෑ හිමිකම තිබුණේ ඔහුටය. මේ බව නොතකා වෙනත් නායකයකු සොයන්නට පක්ෂය තුළ පියවර ගැනුණේය.

ඩී.බී.එස්. ජෙයරාජ් විසිනි

ඊට ප්‍රකට හේතු මෙන්ම අප්‍රකට හේතු ද තිබිණි. ඊට ප්‍රසිද්ධියේ කියාපෑ හේතුව නම්, 'සී.පී. මහජනයාගේ සිත් ඇද බැඳගන්නා නායකයකු නොවේ' ය යන්නයි. ඔහුගේ කාර්යක්ෂමභාවය පොදුවේ පිළිගැනීමට ලක් වුව ද ඒ ඔස්සේ මැතිවරණ ජයක් ලැබීමට ජනතාව ආකර්ෂණය කරගත නොහැකි බවට තර්ක ඉදිරිපත් විය. එම කියමන තුළ යම් සත්‍යයක් ද ගැබ්ව තිබිණි.

සමාජ, දේශපාලන වතාවාරණය

කෙසේ වුව ද වැඩපුර ප්‍රසිද්ධියට පත් නොකළ තවත් හේතුවක් ද තිබිණි. අසභ්‍යය දක්ෂතා සී.පී. සතුව තිබුණ ද රටේ සමාජ, දේශපාලන පරිසරයෙන් මතු වූ ඔහුට අවාසිදායක කාරණාවක් ද පැවැතිණි. ඔහු විශාල ජන සංඛ්‍යාවක් සිටි ගොවිගම කුලයට අයත් වූවෙක් නොවූයේය. සී.පී. ද සිල්වා සාම්ප්‍රදායිකව කුරුඳු කර්මාන්තයේ නියැළුණු සලාගම කුලයට අයත් වූවකු වූයේය. රටේ බහුතරයක් ඉන්නා ගොවිගම කුලයේ අය තමන් කුල ධුරාවලියේ ඉහළින්ම වැජඹෙන අය බව කියා සිටියහ.

සාම්ප්‍රදායික වෘත්තිය අනුව කුලය ප්‍රභවය ලැබුවද ද යල් පැනගිය සමාජ ස්ථරායනය පිළිබඳ මතවාද දේශපාලනයට රහසේ බලපාන සාධකයක් විය. බොහෝ කුලවල උදවිය තමන්ගේ සාම්ප්‍රදායික වෘත්තීන් අතහැර වෙනත් රැකියාවල නිරත වූව ද කුලය යන සාධකය තවමත් විවාහයකවත්, මැතිවරණ කටයුතුවලටත් බලපෑම් කරයි. කුලවාදය දුරුව ගොස් ඇති බවට බොහෝ අය ප්‍රසිද්ධියේ වාද කළ ද එය දේශපාලනයට තවමත් රහසේ බලපාන සාධකයක්ව තිබේ. නායකත්ව ධුරාවලියට විශේෂයෙන් මෙම සාධකය බලපා තිබේ. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා සම්බන්ධයෙන් මෙය සම්මතයෙන් බැහැර වූ ව්‍යතිරේඛයක් වුව ද මෙරටේ අගමැති ධුරය හෝ ජනාධිපති ධුරය දැරූ සෑම අයකුම ගොවිගම කුලයේ අයකු විය. ශ්‍රී ල.නි.ප.ය සී.පී. ද සිල්වා හැර වෙනත් විකල්ප නායකයකු සොයා ගියේ මේ හේතුවෙනි.

ඒ වන විට නායකයන්ට වෙනසක් සිදු නොකළ හැකි වූයෙන් සී.පී. පක්ෂය තුළ තම නායකත්වය තහවුරු කළේය. ඒ අනුව සී.පී.ගේ අණ යටතේ පක්ෂය මැතිවරණය සඳහා සුදුනම් වූයේය. අගමැති ධුරය සඳහා සුදුසුකම් ඇත්තකු ලෙස ඔහු මතු වී පෙනුණි. මැතිවරණ ප්‍රචාරක කටයුතු දියත් වෙද්දී ශ්‍රී ල.නි.ප. අනිවාර්ය පරාජයක් කරා යන බව ද දිස් වූයේය. රැස්වීම්වලට එන සෙනඟ ද අඩු වූ කල, පක්ෂ සාමාජිකයන් අතර උනන්දුව හීන වී ගියේය. එස්.ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායක නැති පක්ෂය, දියේ වීසි වෙමින් ගිලෙන්නට යන බෝට්ටුවක් හා සමාන වූයේය. පක්ෂය ටිකෙන් ටික පිරිහෙන්නට ගත්තේය.

සිරිමාවෝ බණ්ඩාරනායක

පක්ෂය ප්‍රතිසංස්කරණය කොට ජන්දදායකයන්ගේ උනන්දුව දැල්වාලීම සඳහා තවත් අයකුගේ සහභාගිත්වයේ හදිසි අවශ්‍යතාව සී.පී. තේරුම් ගත්තේ මේ අවස්ථාවේදීය. දිවංගත නායකයාණන්ගේ සංවේගයට පත් භාර්යාවට මිස මෙම කාර්යය වෙනත් කා හට කළ හැකි වේ දෑ විඛැවින් සී.පී. සහ ශ්‍රී ල.නි.ප. නායකයෝ මැතිවරණ රැස්වීම් ඇමතීම සඳහා සිරිමාවෝ බණ්ඩාරනායක කැමැති කරවා ගත්හ. සිරිමාවෝ ඊට එකැමැත්තෙන් දෙගිඩියාවෙන් යුතුව එකඟ වූවාය. ඇය මැතිවරණ රැස්වීම් අමතන්නට ගත් විට පැවැති තත්ත්වය කෙමෙන් වෙනස් වන්නට ගත්තේය.

මැතිවරණ ප්‍රකාශයට පත් කරන විට ශ්‍රී ල.නි.ප.ය ජයග්‍රහණය කරන බව නොපෙනුණත් මැතිවරණ දිනය ළඟාවෙත්ම පක්ෂයේ තත්ත්වය යහපත් බව පැහැදිලි වූයේය. ප්‍රතිවිරුද්ධ ප්‍රකාශයට පත් වූ විට ව.ජා.ප.ය ආසන 50ක් දිනා පළමු ස්ථානයට පැමිණි අතර, ශ්‍රී ල.නි.ප.ය ආසන 46ක් දිනා දෙවැනි තැනට ආයේය. ශ්‍රී ල.නි.ප.ය යළිත් පණ ලැබ ඇත්තේ "වැළපෙන වැන්දඹුව නිසා" යයි පුළුල්ව පිළිගැනුණේය. විය දෝලනය වන පාර්ලිමේන්තුවක් වූයේ ඉලංගෙයි තමිල් අරසුකච්චි (ITKF) නම් ඉංග්‍රීසියෙන් ෆෙඩරල් පක්ෂය (FP) යයි හැඳින්වූ පක්ෂයයි.

ෆෙඩරල් පක්ෂයට ආසන 15ක් තිබුණු බැවින් යම් රජයක් බිඳ දැමීමට එයට බලය ඇති බව පැහැදිලිව දිස් වූයේය. ව.ජා.ප.යත්, ශ්‍රී ල.නි.ප.යත් යන දෙකම ෆෙඩරල් පක්ෂ සමඟ සාකච්ඡා ඇරැඹූහ. සාකච්ඡා ගණනාවකින් පසු ශ්‍රී ල.නි.ප.යට සහයෝගය දෙන්නට ෆෙඩරල් පක්ෂය තීරණය කළේය. ඒ, ලිඛිත නොවූ අවබෝධතාවක් මතයි. ශ්‍රී ල.නි.ප. සාකච්ඡා කණ්ඩායමට නායකත්වය දුන්නේ සී.පී. ද සිල්වා ය.

ඩඩ්ලි සේනානායක ආණ්ඩුව

විරුද්ධ පක්ෂයේ වූ බොහෝ පක්ෂ ව.ජා.ප. විරෝධී ඒවා නිසා ඩඩ්ලි සේනානායක යටතේ වූ ව.ජා.ප. ආණ්ඩුවට ප්‍රබල බහුතරයක් නොවීය. මෙය පරීක්ෂා කරන විමසුම වූයේ කතානායක තෝරා ගැනීමේ ජන්දය ය. ඒකාබද්ධ විපක්ෂයේ කතානායක අපේක්ෂකයා වූ ඊ.බී. සුබසිංහ ජන්ද 93ක් ලබා, ජන්ද හැටක් ලබාගත් ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයා වූ සර් ඇල්බට් පීරිස් ව පරාජය කළේය. කතානායක ජන්දයෙන් පසු අප්‍රේල් 22 වැනිද රාජාසන කතාව සිදු වූයේය. ආණ්ඩුව නැවත 86ට 61ක් ලෙස පරාජයට පත්වූයේ අට දෙනකු ජන්දය දීමෙන් වැළකී සිටියදීය.

ආණ්ඩුව විසුරුවා හරින ලෙස ඩඩ්ලි සේනානායක ආණ්ඩුකාර සර් ඔලිවර් ගුණතිලකට උපදෙස් දුන්නේ, ජූලි මාසයේ නව මැතිවරණයක් ප්‍රකාශයට පත් කරන ලෙස ද දන්වමිනි. ව.ජා.ප. රජයේ ආයු කාලය දින 33කට සීමා විය.

සර් ඔලිවර් ගුණතිලක

සියලු විරුද්ධ පක්ෂවල ප්‍රධානීන් රැස්වීමකට කැඳවූ සර් ඔලිවර් ගුණතිලක, මැතිවරණයක් පවත්වනු වෙනුවට තමා විකල්ප රජයක් පිහිටුවීමේ අවකාශ සොයා බැලීමට කැමැති බව ඔවුන්ට දන්වා සිටියේය. ව්‍යවස්ථාව අනුවත්, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුවත්, පාර්ලිමේන්තු සභාවේ බහුතර බලය හිමි පුද්ගලයාට ඊළඟ රජය පිහිටුවන ලෙස ආරාධනා කිරීමට අග්‍රාණ්ඩුකාරවරයා බැඳී සිටියේය. එවර ආසන 46ක් හිමි ශ්‍රී ල.නි.ප.යේ වාරය පැමිණියේය. අග්‍රාමාත්‍ය ධුරය නැවත සී.පී.ගේ ග්‍රහණයට හසුවන දුරට ආයේය.

ශ්‍රී ල.නි.ප. නායක සී.පී. ද සිල්වා ක්වීන්ස් හවුස් වෙත ගොස් තමාට ෆෙඩරල් පක්ෂයේ සහයෝගය ඇතිව අවශ්‍ය පාර්ලිමේන්තු බහුතරය පෙන්විය හැකි බව සර් ඔලිවර් හට දන්වා සිටියේය. එවර සර් ඔලිවර්, ෆෙඩරල් පක්ෂය කැඳවා එහි සහයෝගය ශ්‍රී ල.නි.ප.යට ලැබේ ද යන්න තහවුරු කොට දැනගන්නට උත්සාහ කළේය.

ෆෙඩරල් පක්ෂ (ඉ.ත.අ.ක.) නායක වේල්වනායගම්

සර් ඔලිවර් ගුණතිලක ෆෙඩරල් පක්ෂ නායක එස්.ජේ.වී. වේල්වනායගම් පිළිගෙන, සී.පී. ද සිල්වාට විකල්ප රජයක් පිහිටුවීමේ හැකියාව තහවුරු කොට දැනගන්නට වෑයම් කළේය. ශ්‍රී ල.නි.ප.යට අවශ්‍ය බහුතරය නොලැබේ නම්, සර් ඔලිවර් පාර්ලිමේන්තුව විසුරුවා හරින බව කී විට තමාගේ සහාය සී.පී. ද සිල්වා පිහිටුවන රජයකට දීමට සූදානම් බව වේල්වනායගම් කියා සිටියේය. එවර අවම අවුරුදු දෙකකට විකල්ප රජයක් පිහිටුවීම සඳහා කොන්දේසි විරහිත සහායක් දෙන්නේ ද යන්න සර් ඔලිවර් වේල්වනායගම්ගෙන් විමසුවේ කොන්දේසි විරහිත යන්න අවධාරණය කරමිනි. රජයේ ස්ථාවරත්වය උදෙසා ස්ථිර සහතිකයක් සර් ඔලිවර් හට අවශ්‍ය වූයේය. ෆෙඩරල් පක්ෂයට දී ඇති පොරොන්දු ශ්‍රී ල.නි.ප.ය ඉටු නොකළහොත්, එම සහාය ඉලිහී යන බව ඔහු දැන සිටියේය. අග්‍රාණ්ඩුකාරවරයා ඉල්ලා සිටි කොන්දේසි විරහිත සහාය දීම සඳහා පොරොන්දු නොවෙන්නට නීතිඥයකු වූ වේල්වනායගම් වග බලා ගත්තේය, ඔහු එම පොරොන්දුව දුන්නේ නම් ෆෙඩරල් පක්ෂය අවුරුදු දෙකකට නොගැලවෙන්නට බැඳී සිටින බව වේල්වනායගම් දැනගත්තේය. මාස 24කට ශ්‍රී ල.නි.ප.යට කොන්දේසි විරහිත සහයෝගය දී දේශපාලන

පාර්ලිමේන්තුව විසුරුවා හැරීම

කෙසේ වුව ද අප්‍රේල් 23 වැනිද පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් සර් ඔලිවර් අසාධාරණ ලෙස කටයුතු කළේය. ෆෙඩරල් පක්ෂ නායකයන් නැවත අග්‍රාණ්ඩුකාරවරයා හමුවට පැමිණි විට ගන්නා ලද තීරණය ඔවුන්ට දන්වන ලදී. ඔවුන් පසුතැවෙමින් විරෝධය දැක්වූ විට සර් ඔලිවර් තමා ගන්නා ලද තීරණය සාධාරණ බව කියා පෑමට උත්සාහ ගත්තේ, ඔහු ශ්‍රී ල.නි.ප. නායකත්වයට බහුතරයක් ඇති බව අවබෝධ කරගෙන නොමැති බව කියමිනි. වේල්වනායගම් තමාගේ ප්‍රශ්නයට ඍජු පිළිතුරක් නොදුන් බව ඔහු කියා සිටියේය. එසේම, මහ රැජිනගේ නියෝජිතයා ලෙස තමාට ඇති වරප්‍රසාදය, ව්‍යවස්ථා අර්බුදයක් හා දේශපාලන අස්ථාවරභාවයක් ඇති වීම වැළැක්වීමට ක්‍රියාවේ යෙදවූ බව ද හෙතෙම කියා සිටියේය. කෙසේ වුව ද සර් ඔලිවර් තමාගේ යට් සිතේ ඇති අදහස ෆෙඩරල් පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරන විට හෙළිදරව් කළේ, ගොවිගම නොවන පුද්ගලයකුට අගමැති තනතුර දැරීමට තමාට අභිසර දිය නොහැකි බව ප්‍රකාශ කරමිනි. බළලා මල්ලෙන් එළියට පැන්නේ එවිටය. ඔහු ඒ කීවේ, සලාගම කුලයේ සී.පී. ද සිල්වා ගැන බවට සැක නැත. පසු කාලයේ ද ඒ මතයම් ඔහු ආචාර්ය එන්.එම්. පෙරේරා සමඟ සංවාදයේ යෙදෙන විටකදී ද හෙළිදරව් වූයේය. දේශපාලන විද්‍යාව පිළිබඳ විද්වතකු වූත්, වේල්වනායගම්ගේ බෑනා වූත් ඒ.ජේ. විල්සන් කළ රචනාවල එන්.එම්. පෙරේරා කී දේ උපුටා දක්වා තිබේ. "මා කොහොම ද සලාගම මිනිහෙක් පත් කරන්නේ" යනුවෙන් සර් ඔලිවර් කී බව එහි දැක්වේ.

තමාගේ ව.ජා.ප. පසුබිම අනුව සර් ඔලිවර් පක්ෂග්‍රාහී ක්‍රියා කළ බවට ද ඇතැමිනු තර්ක කළහ. එහිදී ඔහු කළේ, කුලයට ඇදීමට (පක්ෂපාති වීමට) වඩා සේනානායක පවුල සමඟ පැවති සම්ප සම්බන්ධතාවලට අනුව ක්‍රියා කිරීමකැයි ඔවුහු කීහ. අග්‍රාණ්ඩුකාරවරයාගේ තීරණයට කුමන හේතුව බලපෑවත් එහි ප්‍රතිඵලය වූයේ, පාර්ලිමේන්තුව විසුරුවා හැර නව මැතිවරණයක් පැවැත්වීමයි.

ජූලි 19 වැනිද නව මැතිවරණය ප්‍රකාශයට පත්විය. සර් ඔලිවර්ගේ තීරණය තියුණු ලෙස විවේචනයට ලක් වූයේ සී.පී. ද සිල්වාට ප්‍රමාණවත් බහුතරයකින් යුතු රජයක් පිහිටුවීමට අවශ්‍ය සහයෝගය තිබුණු බැවිනි. ඔහුගේ බහුතරය පෙන්වීමට ඔහුට අවස්ථාවක් දිය යුතුව තිබිණි. එසේ කිරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප වූ බැවින්, සී.පී. ද සිල්වාට දෙවැනි වරටත් අගමැති ධුරය නොලැබී ගියේය.

පක්ෂ නායකත්වය වෙනස් වීම

අලුත් මැතිවරණය ඉදිරියේ තිබියදී පක්ෂ නායකත්වය වෙනස් කිරීමට කාලය පැමිණ ඇති බව සී.පී. ද සිල්වා සිතුවේය. සිරිමාවෝ බණ්ඩාරනායකට ඡන්ද දිනා ගැනීමේ ඇති හැකියාව තේරුම් ගත් සී.පී., ඇයට පක්ෂ නායකත්වය පැවරීමේ අරමුණකින් පනප්‍රිය නොවූ ආක්‍රමණශීලී වැඩපිළිවෙළක් දියත් කළේය. මෙම වෑයමට එක් වූ අය අතර ඒ.පී. ජයසූරිය, බද්දේගේ මොහොමඩ් සහ ඩී.ඒ. රාජපක්ෂ (මහින්ද රාජපක්ෂගේ පියා) ද වූහ. බොහෝ ඇවිටිලි කිරීමෙන් පසුව සිරිමාවෝ මැතිනිය පක්ෂ නායකත්වය දරමින් 1960 මැතිවරණ ව්‍යාපාරයේ යෙදීමට තීරණය කළාය.

1960 ජූලි මැතිවරණය ජයගත් සිරිමාවෝ බණ්ඩාරනායක, ලෝකයේ පළමු අගමැතිවරිය බවට පත්වෙමින් ඉතිහාසය වෙනස් කළාය. දෙවරක් අගමැති ධුරය අහිමි වූ සී.පී. ද සිල්වා කැබිනට් මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධානියා බවට පත්විය. බණ්ඩාරනායක සෙනෙට්වරයකුව සිටියදී පාර්ලිමේන්තුවේ අගමැතිවරයා වෙනුවෙන් පිළිතුරු දුන්නේ සී.පී. ද සිල්වාය. බණ්ඩාරනායක රටින් පිටව සිටි අවස්ථාවල ඔහු අගමැති ධුරයේ වැඩ බැලුවේය.

එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක සිටියදී නීත්‍යනුකූලවත්, ඇත්ත වශයෙනුත් රජයේ නියෝජ්‍ය නායකයා වූයේ සී.පී. ද සිල්වාය. සිරිමාවෝ මැතිනිය යටතේ තමා නීත්‍යනුකූලවම පමණක් නියෝජ්‍ය නායකයා බවට පත්ව ඇති බව සී.පී.ට දැනෙන්නට ගත්තේය. සැබෑ නියෝජ්‍ය නායක තනතුරේ විජඹුණේ ෆිලික්ස් ආර්. ධයස් බණ්ඩාරනායකයි. ඔහු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ බෑනාය. 1694 දී ලැ.ඍ.ස.ප. රජයට එක්වීම නිසා සී.පී. ද සිල්වා සිරිමාවෝගෙන් තවදුරටත් ඈත්ව තනි වූයේය.

සී.පී. ද සිල්වාගේ පැනි මාරුව

1964 රාජාසන කතාවට අදළ ජන්ද විමසීමේදී සී.පී. ද සිල්වා ආණ්ඩුවට එරෙහිව ජන්දය පාවිච්චි කළේය. එහිදී ඔහු තවත් මන්ත්‍රීවරුන් 13 දෙනකු සමඟ විපක්ෂයට මාරු වූයේය. සී.පී.ගේ පැති මාරුව සිරිමාවෝ හැඳින්වූයේ, පසුපසින්විත් අයට පිහියෙන් ඇනීමක් ලෙසයි. 1964 දෙසැම්බර් 17 වැනිද පාර්ලිමේන්තුව විසුරුවා හැරිණි. මහ මැතිවරණය පැවැත්වුයේ 1965 මාර්තු 22 වැනිදය. ශ්‍රී ලංකා නිදහස් සමාජවාදී පක්ෂය නමින් සී.පී. ද සිල්වා අලුත් ප